(முழுப் பதிப்புரிமை உடையது)
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 6 ශ්‍රේණිය<br>தரம் 6<br>Grade 6 | භූගෝල විද්‍යාව I හා II පත්‍රය<br>புவியியல் வினாத்தாள்-I-II<br>Geography Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

★ නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

1) පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය වන්නේ

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. 2. පළාතයි
3. ග්‍රාමනිළධාරී කොට්ඨාසයයි. 4. දිස්ත්‍රික්කයයි

2) නිවැරදිව දිශාව හඳුනා ගැනීමට යොදාගන්නා උපකරණය වන්නේ

1. මාලිමා යන්ත්‍රයයි 2. සුළං දිශා දර්ශකයයි
3. අනිල මානයයි 4. බැරෝමීටරයයි

3) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු මුලස්ථානය පිහිටා ඇත්තේ

1. පිදුරුතලාගල කඳුමුදුනේ ය. 2. කොළඹ බෞද්ධාලෝක මාවතේ ය.
3. ත්‍රිකුණාමල වරායේ ය. 4. ගාලු කොටුවේ ය.

4) වේවැල් භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයක් වන්නේ

1. දුම්බර 2. රදාවඩුන්න
3. පිළිමතලාව 4. අම්බලන්ගොඩ

5) කුඹුරුවලට හානිකරන කෘමීන් විනාශ කරන සත්වයෙකි

1. කපුටා 2. ඇටිකුකුළා
3. කුරුමිණියා 4. බත්කූරා

★ පහත දැක්වෙන ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න

6) බස්නාහිර සහ උතුරු දිශාව අතර පිහිටි දිශාව ................................ දිශාවයි.
(ඊසාන, නිරිත, වයඹ)

7) ශ්‍රී ලංකාව බෙදා ඇති දිස්ත්‍රික්ක ගණන ............ කි.

(24, 25, 26)

8) කිසියම් ස්ථානයක කෙටි කාලයක් තුළ වායු ගෝලයේ පවතින ස්වභාවය ........................ යනුවෙන් හඳුන්වයි.

(කාලගුණය, දේශගුණය, වර්ෂාපතනය)

9) කාලගුණික අංග අතර මූලිකාංගය වන්නේ ........................... යි.

(වර්ෂාපතනය, සුළඟ, උෂ්ණත්වය)

10) භූමිය අවිධිමත් ලෙස පරිහරණය කිරීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵලයකි ................

(වර්ෂාව, නායයෑම්, සුළි සුළං)

★ පහත දැක්වෙන වාක්‍ය වලින් කියවෙන අදහස හරි නම් (√) ලකුණද, වැරදිනම් (×) ලකුණද, වාක්‍ය ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

11) චිත්‍රයට වඩා සිතියමකින් භූගෝලීය ලක්ෂණවල පිහිටීම නිශ්චිතව දැක්විය හැකිය. ( )

12) අව්ච්චියා යනු සංචාරක පක්ෂියෙකි. ( )

13) නයා විෂ සහිත සර්පයෙක් නොවේ. ( )

14) ගංගා නිම්න ප්‍රදේශවල තේ වගාව බහුල ලෙස වගා කරයි. ( )

15) වායු දූෂණය නිසා ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග ඇති වේ. ( )

★ පහත "අ" තීරුවට ගැළපෙන පිළිතුර "ආ" තීරුවෙන් තෝරා අදාළ වරහන තුළ පිළිතුරට අදාළ ඉංග්‍රීසි අක්ෂරය යොදන්න.

| අ | | ආ |
|---|---|---|
| 16) සුළඟේ වේගය මැනීමට භාවිත කරන උපකරණය. | ( ) | A ගෙම්බා |
| 17) කාලගුණ අනාවැකි පළකරන සතෙකි. | ( ) | B තුණු ගල් කැඩීම |
| 18) ජලය හිඟවීමෙන් ඇති විය හැකි ගැටලුවකි. | ( ) | C සුළං දිශා දර්ශකය |
| 19) නීති මගින් ආරක්ෂා කරගත යුතු සත්වයකි. | ( ) | D කබරයා |
| 20) අවිධිමත් ලෙස භූමිය පරිහරණය කරන ආකාරයකි. | ( ) | E අනිල මානය |
| | | F පාංශු ඛාදනය |
| | | G පස නිසරුවීම |

(ලකුණු 20 x 2 = 40)



97

දෙවන වාර ඇගයීම 2016

භූගෝල විද්‍යාව II කොටස

6 ශ්‍රේණිය

උපදෙස් :-

- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

01) I ශ්‍රී ලංකාව බෙදා ඇති පරිපාලන ඒකක තුනක් නම් කරන්න. (ලකුණු 03)

II a. ඔබේ පාසල පිහිටි පළාත නම් කරන්න.

b. එම පළාත ආසන්නයේ පිහිටි පළාත් තුනක් නම් කරන්න. (ලකුණු 04)

III පරිපාලන කොට්ඨාස ධුරාවලිය තුළ ඔබේ පාසලේ පිහිටීම ඇඳ දක්වන්න.


(ලකුණු 05)

02) I කාලගුණය පිළිබඳව තොරතුරු දැනගැනීම වැදගත් වන පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

II කාලගුණික අංග හතරක් නම් කරන්න. (ලකුණු 04)

III කාලගුණික තොරතුරු දැන ගැනීමෙන් පුද්ගලයාට ලැබෙන වාසි දෙකක් දක්වා ඉන් එකක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05)

03) I ජල චක්‍රය ඇතිවීමේදී සිදුවන ක්‍රියාවලිය පහත රූප සටහනෙන් දක්වා ඇත. එහි A, B, C අක්ෂර වලින් දැක්වෙන ක්‍රියාවලි ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.




(ලකුණු 03)

II. පහත සඳහන් අවස්ථාවල අහසෙහි ස්වභාවය ලියා දක්වන්න. (ලකුණු 04)

a. වර්ෂාව ඇතිවීමට ආසන්න වූ විට.

b. අහසේ වලාකුළු නොමැති විට

III වර්ෂා මානයක් සකස් කරන ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 05)

04) I ශාක වලින් මිනිසාට ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II ශාක වලින් පරිසරයට ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III පහත සඳහන් සතුන්ගෙන් ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න.

a. ඇට් කුකුළා :-

b. වේයා :-

c. ගැඩවිලා :-


d. කපුටා :-

e. වවුලා :- (ලකුණු 05)

05) I ඔබ ජීවත්වන පළාත තුළ වාසය කරන ජන වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

II අපේ රට තුළ ජීවත්වන ප්‍රජාව අදහන ආගම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III A, B, C, D පින්තූර ආශ්‍රයෙන් දැක්වෙන ආගමික සංකේත වලට අදාළ ආගමික උත්සවය බැගින් නම් කරන්න.




(ලකුණු 05)

06) I අප රටේ කෘෂි කර්මාන්තයේ ප්‍රධාන අංශ තුන දක්වන්න. (ලකුණු 03)

II භූමිය ප්‍රයෝජනයට ගත හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III අවිධිමත් භූමි පරිභෝජනයේ ප්‍රතිඵල දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07) I ජලය දූෂණය විය හැකි ක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II ජලය හිඟවීමෙන් ඇති විය හැකි ගැටලු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III ජලය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගත හැකි පියවර දෙකක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)